**කොළඹ දිසා අධිකරණයේදීය.**

නිහාල් ශ්‍රී අමරසේකර,

අංක 167/4, ශ්‍රී විපුලසේන මාවත, කොළඹ 10.

නඩු අංකය:-

පැමිණිලිකරු.

21819/එම්.ආර්.

1. ගාමිණී ලක්මන් පීරිස්,

'විසුම්පාය', ස්ටේපල්ස් වීදිය, කොළඹ 02

සහ අංක 37 ක්‍රීඩා පෙදෙස, කොළඹ 05 සහ

තවත් අයෙක්.

විත්තිකරු.

1999.05.17

**- නි යෝ ග ය -**

පැමිණිලිකරු විසින් පළමුවන විත්තිකරුට විරුද්ධව සහන ලබාගැනීම සඳහා මෙම නඩුව, ව්‍යුත්පන්න නඩුකරයක් (Derivative action) වශයෙන් ඉදිරිපත් කර ඇත.

02 වන විත්තිකාර ලෙහමන් [illegible] (ලංකා) ලිමිටඩ් විසින් දැනටමත් උත්තරයක් ඉදිරිපත් කර ඇති අතර, පැමිණිල්ලේ අන්තර්ගතවල සඳහන් සෙසු සහන අතරින් පැමිණිල්ල නිෂ්ප්‍රභා කරන ලෙස ඉල්ලා ඇත. එසේ වුවද පළමුවන විත්තිකරු මෙම නඩුවේ තවමත් උත්තර ප්‍රකාශයක් ඉදිරිපත් කර ඇති අතර 1999.02.16 දින දරණ මෝසම ඉදිරිපත් කරමින්, එකී මොසමේ සඳහන් හේතූන් මත පැමිණිල්ල භාරගැනීම මුලසිටම බලපාන ලෙස නිෂ්ප්‍රභා කරන ලෙස අයැද ඇත.

01 වන විත්තිකරුගේ එකී මෝසමේ සඳහන් කරුණු පසුබිම තුළ පහත එපරිද්දෙන්ම උපුටා දක්වමි. 01 වන විත්තිකරුගේ එකී මෝසම මෙසේය.

1. පැමිණිල්ල ඉතාමත් නොසැලකිල්ලෙන් (Per Incuriam) භාරගෙන ඇති බවද, වෙනත් හේතු අතුරම පහත දැක්වෙන හේතු නිසා පැමිණිල්ල ප්‍රතික්ෂේප කළයුතු බව සහ/හෝ නඩුව නිෂ්ප්‍රභා කළයුතු බව අපි ගරු අධිකරණයට දන්වා සිටිමු.

(අ) වෙනත් හේතු අතර මේ පහත දැක්වෙන හේතු නිසා පැමිණිල්ලෙන් නඩු නිමිත්තක් අනාවරණය නොවේ.

(i) පැමිණිල්ලෙන් මුහුණත අනුව ව්‍යුත්පන්න නඩුවක් අනාවරණය නොවේ.

(ii) කෙසේ වුවද, පැමිණිල්ලේ දක්වා ඇති කරුණු මත හොටෙල් ඩිවලොපර්ස්(ලංකා) ලිමිටඩ් සමාගමට නඩුවක් නොමැති වන්නට තිබුණි.

(ආ) පැමිණිලිකරුගේ උද්දේශිත හිමිකම්පෑම සහ/හෝ උද්දේශිත නඩු නිමිත්ත පැමිණිල්ලේ මුහුණත අනුව කාලසීමාවෙන් වී ඇත.

(ඇ) මුහුණත අනුව, විත්තිකරුගේ පෞද්ගලික ක්‍රියාවකින් මිහුට උද්දේශිත හිමිකම්පෑම සහ/හෝ නිමිත්තක් නැත.

2. ඉහත කී අවස්ථාවක් තිබුණු අනුව පැමිණිල්ල ප්‍රතික්ෂේප කිරීමට සහ/හෝ නඩුව නිෂ්ප්‍රභා කරන මෙන් අපි ගරු අධිකරණයෙන් ඉල්ලා සිටිමු. මෙම මෝසමේ දැනුම්දීම් 1998 පෙබරවාරි 19 වන දින ගරු අධිකරණයේ මෙම නඩුව කැඳවන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

එකී මෝසමේ සඳහන් කරුණු පිළිබඳව දෙපාර්ශ්වයේ නීතිඥවරුන් විසින් වාචික හා ලිඛිත දැක්වීම් ඉදිරිපත් කරනු ලැබ ඇති අතර, 02 වන විත්තිකාර සමාගම අදාළ මෝසම මත දෙනු ලබන නියෝගය කුමක් වුවද එය

එපරිද්දෙන්ම පිළිගැනීමට එකඟත්වය පළකර ඇත.

වත්මන් නියෝගය අදාළ වනුයේ 01 වන විත්තිකරුගේ ඉහත සඳහන් මෝසම මත අයැද ඇති සහන ලැබිය යුතුද යන්න සළකා බැලීම සඳහාය.

01 වන විත්තිකරුගේ මෝසමේ සඳහම වන්නේ ප්‍රශ්න ගත පැමිණිල්ල ප්‍රමාද දෝෂයකින් ( perincuriam ) භාරගෙන ඇති බවත්, එම හේතුව නිසාම "අතීතයේ සිදුකල යුතුව තිබුණ දෑ වර්තමානයේ සිදුකිරීම"(Nunc pro Tunc ) නම්වූ නෛතික සිද්ධාන්තය මත පැමිණිල්ල මෙම අවස්ථාවේ වුවද නිෂ්ප්‍රභා කළ හැකි බවත්ය.

මේ සම්බන්ධයෙන් මූලික වශයෙන් බලපාන කරුණ නම් ඉහත ජේදයේ සඳහන් බලය ක්‍රියාත්මක කිරීමට අනුගමනය කළයුතු ක්‍රියාපටිපාටිය කුමක්ද යන්නයි? 01 වන විත්තිකරුගේ තර්කය වන්නේ එවන් කරුණක් මෝසමකින් මතුකල හැකි බවයි.

මේ පිළිබඳව අබිචාදුම්මා එදිරිව කාසිනාදුර් (එන්.එල්.ආර්.199 ) පිටුවේ වාර්තා ගත නඩු තීන්දුව මඟින් සහ එම තීන්දුව වනුව, හෝ අ අනාවාකරයකින් අනුගමනය කර ඇති (1) ෆොන්සේකා එදිරිව ෆොන්සේකා (1989-2-එල්.ඒ.ආර්.95) සහ මුදලි අප්පුහාමි එදිරිව පිනාරාල 12 සී. එල්.ආර්.30) නඩු තීන්දු අනුගමය පූර්වාදර්ශ( precedents ) ලෙස සැලකිරීමට මා බැඳී සිටින බව තීරණය කරමි.

පැමිණිලිකරුවන්ගේ ස්ථාවරය වී ඇත්තේ දැනටමත් 01 වන හා 02 වන විත්තිකරුවන් පිළිවෙලින් 1999.01.22 සහ 1999.01.21 දිනවල (මෝසම ඉදිරිපත් කිරීමට පෙර ) උත්තර ප්‍රත්‍යුත්තර ඉදිරිපත් කර ඇති බවත්, එම හේතුව නිසා අදාළ මෝසම මත කරුණු තීරණය කොට සිවිල් නඩු විධාන සංග්‍රහ පණතේ X1X පරිච්ඡේදය යටතේ කරුණු සලකා බැලිය යුතු බවත්ය.

**පැමිණිල්ලේ මෙම තර්කය බැහැ බැල්මට විත්තියේ තර්කයට වඩා මහගර ඉහ ආකර්ෂණවත්ය. එය මූලු බැල්මට සාරවත් තර්කයක් ලෙස පිළිගැනිය හැක්කේ, පොන්සේකා එදිරිව පොන්සේකා නඩු තීන්දුව අනුවම මෝසමක් මගින් පැමිණිල්ල නිෂ්ප්‍රභා කළයුතු ලෙස ඉල්ලා සිටිය යුත්තේ පැමිණිල්ලට උත්තරවාද දමට පූර්වයෙන් බවයි. මෙම නෛතික අවශ්‍යතාවය එකී තීන්දුවේ 100 වන පිටුවේ සඳහන්ව ඇත්තේ මෙසේය.**

The defendant should move to have the plaint taken off the file for want of particulars before pleading to the merits.

**කාර්ය සටහන් දෙස නෙත් යොමන විටද පැහැදිලිව පෙන යන්නේ පැමිණිල්ල සමග 1 වන විත්තිකරුව සිතාසි භාරදීමෙන් පසු 01 වන විත්තිකරු උත්තර ඉදිරිපත් කිරීමට කල් ඉල්ලා ඇති බව හා ඉන්පසු ඇත්ත වශයෙන්ම 1999.01.22 දින උත්තර ප්‍රකාශය ඉදිරිපත් කර ඇති බවයි.**

**විත්ති වාචක ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් පළමු හා දෙවන විත්තිකරුවන් ස්වකීය අභිමතය පරිදි තෝරා ගැනීමට මනාපය දන්වා ඇත්තේ (මෝසම ඉදිරිපත් කිරීමට නොව) සිවිල් නඩු විධාන සංග්‍රහ පනතේ 55 වගන්තිය සමග කියවිය යුතු 75 වගන්තිය යටතේ වූ උත්තරවාදය/ මෙම අවස්ථාවේ 146 යටතේ ප්‍රශ්න කොතර පැමිණිල්ල නිෂ්ප්‍රභා කිරීම සඳහා බැලීමට ප්‍රමාද නෛතික බාධකයක් බව අධිකරණ-**

අධිකරණයේ මතය වේ.

මෙම හේතූන් කරුණු කොට ගෙන ඉහත මෝසම මගින් දක්වා ඇති සියළු කරුණු එයට පෙර උත්තරයෙන් මතුකර ඇති බැවින්, නඩු විභාගය ආරම්භ කල පසු එය සළකා බැලීමට සටහන් කර තබමි.

මේ අනුව පැමිණිල්ල නිශ්ප්‍රභා කරන ලෙස 1 වන විත්තිකරු විසින් ඉදිරිපත් කර ඇති මෝසම ප්‍රතික්ෂේප කරමි.

අ/කලේ,
(ඒ.ඩබ්.ඒ.සලාම්)
දිසා විනිසුරු-කොළඹ - 99.05.17

(28) 99.05.17

නියෝගය :-
පැමිණිල්ලට නීතිඥ මුවන්දිරම් මහතා පෙනී සිටී.

1 විත්තිකරුට සුදත් පෙරේරා මහතා

2 විත්තිකරුට නීතිඥ අරුල් ප්‍රකාශන් මයා
නියෝගය ප්‍රකාශකරමි.

ලිඛිත විසඳිය යුතු ප්‍රශ්ණ ඉදිරිපත් කිරීම සහ විභාගය - 99.06.9

(ලිඛිත විසඳිය යුතු ප්‍රශ්න විභාග දිනයට සතියකට පෙර විරුද්ධ පක්ෂයට දැන්වීම සහිතව ඉදි/කළ යුතුය.

අ/කලේ,
දි.වි.

---

ඉහතින් දැක්වෙන්නේ කොළඹ දිසා අධිකරණ නඩු අංක21819/එම්.ආර්. දරණ නඩුවේ 99.05.17 දින නියෝගය සහ කාර්ය සටහන් 28 හි සත්‍ය පිටපතක් බව මෙයින් සහතික කරමි.

RManean

රෙජිස්ට්‍රාර්.

[illegible] ලියනය කලේ:-
සැසඳුවේ:-
W/19 052905

අතිරේක රෙජිස්ට්‍රාර් / පිස්කාල්
දිසා අධිකරණය
අළුත්කඩෙ
කොළඹ - 12.